ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2515/04 – 2026 නොවැම්බර් මස 16 වැනි සඳුදා – 2026.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

III වැනි කොටස – ඉඩම්

ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

33 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: KDS/PDB/4/3/2/21-01.

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම්, එස්.එන්. කේ. සේරසිංහ වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය මඟින් විස්තර කරන ඉඩම් කැබැල්ල අත්කර ගැනීම සඳහා ගෙවන ලද වන්දි මුදලට අදාළ පොලී මුදල වන රුපියල් එක් ලක්ෂ හතලිස් පන්දහස් දෙසිය හතයි ශත පනහක් (රු. 145,207.50) අයිතිකරුවන්ට ලබා ගැනීම පිණිස, මහනුවර දිසා අධිකරණයේ නඩු අංක LAD/14/26 යටතේ බැරකර ඇති බව මෙයින් දන්වමි.

එස්.එන්.කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2026 නොවැම්බර් මස 04 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

ගම	: ගිරාකඩුව
ඉඩමේ නම	: තොටපිටියාවත්ත
පිඹුරු අංකය	: කැ.සි. 321097-1-2
කැබලි අංකය	: 01
ප්‍රමාණය	: 0.0217 හෙක්.

පිහිටීම:-

උතුරට:- මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ එන්.එම්. කොයින්මැණිකේ සහ තවත් අය හිමිකම් කියන තොටපිටියාවත්ත; නැගෙනහිරට:- එම්.එච්.එම්.ටී.බී. හේරත් හිමිකම් කියන හෙලේහේන, කැබලි අංක 2, ටී.ජී. මැණිකේ හිමිකම් කියන හෙලේහේන සහ එන්.එම්. කොයින්මැණිකේ හිමිකම් කියන තොටපිටියාවත්ත; දකුණට:- එන්.එම්. කොයින්මැණිකේ සහ තවත් අය හිමිකම් කියන තොටපිටියාවත්ත, ජී.අත්තනායක හිමිකම් කියන ගිරාකඩුවවත්ත සහ කේ.සී.බී. කරුණාගම හිමිකම් කියන ගිරාකඩුවවත්ත; බටහිරට:- කේ.සී.බී. කරුණාගම හිමිකම් කියන ගිරාකඩුවවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව).

EOG 11-0075

1A – G 048532 – 13 (2026/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*